# උපන් බිමේත් එහි ජනතාවගේත් සුභසිද්ධිය උදෙසා ඉදිරිපත් වන්නට මෙ රට වසන්නා වූ සහ විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට සහ සුභසිද්ධිය පතන්නන්ට සුවිශේෂී අවස්ථාවක්

# අතිරේක පොලියක් සහිත විශේෂ තැන්පතු ගිණුම

## යෝජිත විශේෂ තැන්පතු ගිණුමේ ප්‍රධාන ලක්ෂණ

### 1. සුදුසුකම් ලත් තැනැත්තන්

(අ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික පුද්ගලයන්
(ආ) ද්විත්ව පුරවැසියන්
(ඇ) ශ්‍රී ලාංකීය සම්භවයක් ඇති වෙනත් රටවල පුරවැසියන්
(ඈ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයන්
(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත/ලියාපදිංචි කළ අරමුදල්, සංස්ථාපිත මණ්ඩල, සංගම්
(ඊ) සුභසිද්ධිය පතන ඕනෑ ම පාර්ශ්වයක්

### 2. විශේෂ තැන්පතු ගිණුමක් විවෘත කරන්නේ කෙසේද?

i. ශ්‍රී ලංකාවේ අරමුදල් තැන්පත් කිරීමට අපේක්ෂා කරන සුදුසුකම් ලත් තැනැත්තන් හට බලයලත් වෙළෙඳුන් (ඕනෑ ම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව) සමග **“විශේෂ තැන්පතු ගිණුම”** විවෘත කිරීම සහ පවත්වාගෙන යෑම සිදු කළ හැකි ය.

ii. අදාළ නියෝගයේ දිනයේ සිට මාස හයක කාලයක් ඇතුළත බැංකු පද්ධතිය හරහා ලැබෙන ආමුඛ ප්‍රේෂණවලින් විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම අවශ්‍ය වේ.

iii. ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දකු සමග ආමුඛ ආයෝජන ගිණුමක් හෝ අක්වෙරළ බැංකු ඒකකයක ගිණුමක් ඇති ඕනෑ ම පුද්ගලයකුට එම ගිණුම හරහා තම අරමුදල් විශේෂ තැන්පතු ගිණුමේ බැරට ප්‍රේෂණය කළ හැකි ය.

### 3. විශේෂ තැන්පතු ගිණුමේ වැදගත් ලක්ෂණ

- විශේෂ තැන්පතු ගිණුම මාස හයක අවම කාලසීමාවක් සහිත ස්ථිර තැන්පතුවකි.
- නම් කරන ලද ඕනෑ ම විදේශ ව්‍යවහාර මුදලකින්* හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘත කළ හැකි ය.
- හවුල් ගිණුමක් ලෙස විවෘත කළ හැකි ය.

### 4. විශේෂ තැන්පතු ගිණුමක් විවෘත කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවාද?

- සාමාන්‍ය ස්ථාවර තැන්පතු සඳහා අදාළ බැංකු ඉදිරිපත් කරන අනුපාතයට වඩා **ඉහළ පොලී අනුපාතයක්** (කල් පිරීමේ දී පොලිය ගෙවනු ලැබේ).
  - ♦ මාස 6ක තැන්පතු සඳහා - සාමාන්‍ය අනුපාතයට වඩා වාර්ෂිකව ප්‍රතිශතාංක 1ක්
  - ♦ මාස 12ක තැන්පතු සඳහා - සාමාන්‍ය අනුපාතයට වඩා වාර්ෂිකව ප්‍රතිශතාංක 2ක්
- කල් පිරීමේ දී, පරිවර්තනය සහ ශ්‍රී ලංකාවෙන් පිටතට ආපසු යැවීම නිදහසේ සිදු කළ හැකි ය.
- 2017-11-17 දිනැති අංක 2045/56 දරන ගැසට් නිවේදනයෙහි පළ කරන ලද කිසිදු විදේශ විනිමය නියෝගයකට යටත් නොවේ.
- කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් පීඩාවට පත් ශ්‍රී ලංකාවේ වෙසෙන ජනතාවට සහාය දැක්වීම සඳහා දේශප්‍රේමී ශ්‍රී ලාංකිකයන් සහ සුභසිද්ධිය පතන පාර්ශ්වයන්ට මෙමගින් අවස්ථාව ලැබේ.

**ඉහත කරුණුවලට අදාළ නියෝග සහ විධාන ඉක්මනින් ම නිකුත් කෙරේ.**

* නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්: ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් (ඇ.එ.ජ. ඩොලර්), යුරෝ, ස්ටර්ලිං පවුම්, ඕස්ට්‍රේලියානු ඩොලර්, සිංගප්පූරු ඩොලර්, ස්වීඩන ක්‍රෝනර්, ස්විස් ෆ්‍රෑන්ක්, කැනේඩියානු ඩොලර්, හොංකොං ඩොලර්, ජපන් යෙන්, ඩෙන්මාර්ක ක්‍රෝනර්, නෝර්වීජියානු ක්‍රෝනර්, චීන රෙන්මින්බි සහ නවසීලන්ත ඩොලර් ය.